# රිසානා සහ අපි




රිසානා නෆික්, වයස අවුරුදු දහ හතේදී වයස වෙනස් කරගෙන තම පවුල විඳින දුක් ගැහැටෙන් ගොඩවෙන්න සවුදි අරාබියට ගිය ලාබාල තරුණිය, වැඩ කරපු ගෙදර මාස තුනක් හතරක් පමණ වයසැති කිරි දරුවට කිරි දෙන්න ගිහිල්ලා අත් වැරැද්දකින් කිරි හිරවෙලා දරුව මැරිලා. අන්තිමේදී මේක මිනිමැරුමක් බවට පරිවර්තනය වෙලා. වසර හතක් තිස්සෙ නඩු අහලා මීට මාස එකහමාරකට පමණ කලින් ෂරියා නීතියට අනුව හිස ගසා දැමූ රිසානා, අද අපට රිසානාලාව අමතකව ගිහිල්ලා. එයට ඉහලින් තවත් අළුත් දේවල් එකතු වෙන කාලයක රිසානා ගැන ලියන්න හිතුනා, මැද පෙරදිග වහල් සේවයට යන තරුණියන් ගැන අපේ රට කරවන ඇත්තන් ගන්න ක්‍රියාමාර්ග ගඟට කපන ඉනි වගේ ගලා ගෙන යන නිසා.

රිසානා හිරේ දුක් විඳිද්දී ඇයව අමතකව ගිහිල්ලා කරලියට ආපු උල් කටු අන්නල එවපු කාන්තාවො ගැන අද අමතකව ගිහිල්ලා. තවත් බෙල්ල ගහල යන දෙයක් සිද්ධ වෙනකං බලා ඉන්න විදේශ සේවා ලොක්කො ටික, ටික කලකින් රිසානාවත් අමතක කරල දාලා ඒක ගැන කතාකරන ඇඟ පුරාම යකඩ උල් කටු රත් කරල ඇනල මෙහාට එවපු ගෘහ සේවිකාවන්ට මොනව වුනාද කියල කවුරුවත් දන්නෙ නැති කාලයක්. ඊට පස්සේ බිල්ඩින් වලින් පැනල, තල්ලු කරලා මිනී පෙට්ටි ආපු කාලය පහුවෙලා ආව රිසානාගේ හිස් ගෙඩිය දං ගෙඩියට යාම.

දුප්පත්කම, දරිද්‍රතාව නිසා එදා වේල හොයාගන්න මැද පෙරදිග යන කාන්තා පරපුරට නොව, අපේ රටේ එදා සිට මෙදා දක්වා රට කරවන කරපු පාලකයන්ට හිතන්නට බොහෝ දෑ ඉතිරි කරල රිසානා අවසන් ගමන් ගිහිල්ලා. තමන්ව බේරා දෙන්න කියල අඬ අඬා ඉල්ලපු රිසානා සවුදි කාන්තාරෙ මිහිදන් වෙනකොට, ඇයට ලොකු දෑවැද්දක් ලැබුණා. ඒ තමයි නව නිවසක්. ජීවිතයක් වෙනුවෙන් පවුලෙ කට්ටියට නිවසක් ලැබීම ගැ, සැප විඳින ලොක්කො සතුටු වුනත්, රිසානාලගෙ අම්මල තාත්තලා ඒ වෙනුවෙන් සතුටක් ලබයිද ?




මුතූර් පෙදෙස ගමක දුප්පත් වෙලා ඉපදුනු රිසානලා ඇයි මෙතරම් දුප්පත් වුනේ කියන කාරණය ගැන පසුවට කතා කරල ඇයගෙ අනෙක් පසුබිම ගැන කතා කළොත් ඇය මුස්ලිම් තරුණියක්. මුස්ලිම් පාසැලකට ගිහිල්ලා ආගම දහම ගැන ඉගෙනුම ලබපු අය කිසි දිනක සිතන්නට නැතිව ඇති මුස්ලිම් රටක මුස්ලිම්වරුන් අතින් හිස් ගැසුම් කන්නට සිදු වේවි යයි කියල. වයස අවුරුදු දහ හතේදී ඒජන්සිකාරය වෙනස් කරල පාස්පෝට් හදනකොට ඇය රත්තරන් අනාගතයක සිහින දකින්නට ඇති. දුප්පත්කමයි, නූගත්කමයි එකතු වුනාම ඇගේ දෙමව්පියන්ටත් හිතෙන්නෙ නැතිව ඇති මේ කරන්නෙ ලොකු වරදක් කියලා. මොකද බඩ ගින්දරට මේ ඔක්කොම යටපත් වෙන නිසා. වයස වෙනස් කරගන්න එක ඔවුන් ලොකුවට හිතන්නෙ නැතිව ඇති. ඒ වගේම රිසානාව යැවෙන්නේ කිරි දරුවෙක් ඉන්න ගෙදරකට. එතකොට මේ ගෙදර හාම්පුතාගෙ බිරිඳ, කිරි දෙන එක රිසානාට බාර දීලා ගියේ කොහිද ? ඒ වගේම මෙම යක්ෂණිය මාස දෙක තුනෙන්ම මව් කිරි අත හැරල දාලා පිට දේශකින් ආපු නන්නාඳුනන කෙල්ලෙකුට දරුව බාරදීල රෝන්දෙක යන්න තරම් දරු කැක්කුමක්, හිතක් පපුවක් නැති ගැහැණියක් නේද කියල කල්පනා වෙනව.

එතකොට මුතූර් පල්ලියේ රිසානාලගෙ දෙමව්පියො ඥාතියො යාඥා කරන්න යන පල්ලියේ පූජකතුමා, ඔහු කියල තියෙනව හැම දෙයකටම වඩා ෂරියා නීතිය ඉහළයි. රිසානාව ඝාතනය කරපු එක හරි. දොස් කියල ආගමට ගරහන්න එපා කියලා. ඒ වගේම බොහෝ මුස්ලිම් දේශපාලන නායකයන් පවා මේ පිළිබඳව වැඩිදුර කතා කළේ නැහැ. ඔවුන් නිහඬවම මේ තිරස්චින ක්‍රියාව අනුමත කරන පාටක් පේනව. ඒ කියන්නේ මනුස්සකමට වැඩිය තමන්ගෙ ආගමේ නීතිය ඔළුව උඩ තියන් ඉන්න දැඩි ආගම්වාදීන්ට රිසානා මරාදාපු එක හරි වෙන්න පුළුවන්. ඒත මේ වෙනුවෙන් ජාති ආගම් වාදී පටු බේදවලින් තොරව දුක් වුණු විශාල පිරිසක් ලංකාවෙ හිටිය. ඔවුන් බහුතරයක් සිංහලයො, ඒ නිසා අපිට මෙහිදී වැදගත් වෙන්නෙ රිසානා කුමන ජාතිකයෙක්ද කියන එක නෙමෙයි. ඇය අපේම රටේ උපන් අපේම එකෙක් කියන එක විතරයි. ඒ නිසා අපේ එකෙක් ලෝකෙ වෙනත් රටකට ගිහිල්ලා අසාධාරණයක් වුණාම, ඒ රටේ එවුන් බලන්නෙ නැහැ ජාතිය, ආගම. එකම ලේබලය ලැබෙන්නෙ ඇය හෝ ඔහු ශ්‍රී ලාංකිකයෙක් කියන එක විතරයි.




මා මුලින්ම සේවය කළෙත් මැද පෙරදිග, මට මතකයි මං ගිය ගුවන් යානෙම එහා අසුනෙ වාඩි වෙලා ඇස්වල කඳුළු පුරෝගෙන ගිය කාන්තාව. එයාර් ලංකා ගුවන් යානෙ වළාකුළු අස්සෙ රිංගන කොට ඇය අඬන්න පටන් ගත්ත. ඇයගෙ ගම අනුරාධපුරේ. දරුවො හතර දෙනෙක් ඉන්නව කිව්ව. ළමයින්ගේ තාත්තා බේබදු කමට වැටිල. පවුල නාස්ති වෙලා. ඇය ගුවන් යානෙදි කිසිම දෙයක් කෑවෙ නැහැ. දරුවො මතක් වෙනව කිය කියා අඬ අඬා ගිහිල්ලා බඩගින්නෙම තමයි ගොඩ බැස්සෙ. ඊට පස්සෙ එහෙ ගුවන් තොටුපලේදී මං දැක්කා අරාබි හාම්පුතා ඇවිල්ලා ඇයව අරගෙන යනව.

දුප්පත්කම බේබදුකම නිසාම රට ගිය කාන්තාවො ලක්ෂ ගණන් මැද පෙරදිග ගොඩ බාන කොට අපේ රටේ ප්‍රධානතම විදේශ විනිමය සම්පතක් බවට එය පත් වුණා. ඒ අපේ රටේ දූෂණ වංචා එක්ක




**‘දෙයියනේ, මොකෑ මහ රජාණෙනි මේ පස්ස පැත්ත නිල් වෙලා තියෙන්නේ?’**

**‘පළමුවත් මව්බිම, දෙවනුවත් මව්බිම, තෙවනුවත් මව්බිම කියලා පසඟ පිහිටුවලා මාතෘ භූමියට වැඳලා, නැගිටින කොට බැලන්ස් නැතුව ගිහින් පස්ස බිම ඇණුනා බං.’**

**‘ඉක්මනට වේට්ටිය මාරු කරගත්තොත් හොඳා, අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණකාරයෝ වටකරගන්න ඉස්සෙල්ලා.’**

**‘මම ඕකුන්ට බය නෑ බං.’**

**‘බයකටම නෙවෙයි රජතුමනි, ඕකට තෙල් බේත් සත්කාරයක් කරන්න කියලා කාමරේකට එක්ක ගිහිල්ලා, වෙන මොනව හරි කළොත් එහෙම වස වැරැද්දක්නේ වෙන්නේ’**

**‘මම යනවද බං එහෙම උන්ගේ පදේට කාමර අස්සේ රිංගන්න’**

**‘ඔබ වහන්සේ එන්න කියපුවම කාමරවලට රිංගන දඩබ්බරයන්ගේ කන අතගාලා උන්ව හීලෑ කරගන්න අලුත් ක්‍රමවේදයක් මෑතක ඉදලා අත්හදා බලනවා කියන්නේ ඇත්තද රජෝ?’**

**‘තවම වැඩේ පටන් ගත්තේ නෑ බං. මීඩියා කැම්පේන් එක ඔය යන්නේ.’**

**‘ඔය විදිහට කොච්චර කාලයක් යන්න පුළුවන්වෙයිද රජෝ. ගෙම්බෝ ටිකක් එහා පැත්තට පැන්නොත් දැන් ඉතිං රජාට විරුද්ධවත් දෝෂාභියෝගයක් එන්න පුළුවන් නේද?’**

**‘ඒව ගැන හිතලනේ බං මුලින්ම මගේ අයියණ්ඩිව කතානායක කළේ. අයිය බාරගන්නවද බං මට විරුද්ධව දෝෂාභියෝගයක්.’**

**‘අයියගේ නායක කමටත් කෙළවලා, ඕකක් ගෙනාවොත්?**

**‘එහෙම වුණොත් මම 225වම ඇමැතිකම් දෙනවා බං. මොකද මගේ අතෙන් පයෙන් යනවයැ. හොං හොං හොං.**

**ම.රා. සාද්**

**සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න**

03 8707 4604 / 0402 025 516

**email** sannasanews@gmail.com
ads.sannasa@gmail.com